Australian Government
Department of Home Affairs

# කෝවිඩ්-19 පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිවුවද, ඔබ විසින් මහජන සෞඛ්‍යය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

# මා හට ප්රාදේශීය කුසලතා (තාවකාලික) (Skilled Regional (Provisional)) වීසා බලපත්රයක් ඇත (වීසා උප කාණ්ඩ 489, 491 සහ 494)

මෙම වීසා බලපත්ර ප්රාදේශීය ඕස්ට්‍රේලියාවේ ජීවත්වී වැඩ කිරීමට අවශ්‍ය, කුසලතා සේවකයන් හට ස්ථිර වීසා බලපත්රයකට මං පාදන තාවකාලික වීසා බලපත්රවේ.

මෙම වීසා බලපත්ර මගින් ප්රාදේශීය ආර්ථිකවලට උපකාර කීරීම සඳහා ප්රදේශීය ප්රජාවන් සහ ව්යාපාරවලට කුසලතා සංක්රමණිකයන් හට ප්රවේශවීමට සහ සංක්රමණිකයන් සහ ඔවුන්ගේ පවුල්වල අය හට ප්රාදේශීය ප්රජා වෙත ගොස් පදිංචිවීම උනන්දු කිරීම සඳහා උපකාර කෙරේ

# කෝවිඩ්-19 සහන

දේශ සීමා වසා දැමීම, ව්‍යාපාර මත පැනවූ සීමා සහ ආර්ථික අවපාතනය ආදී කෝවිඩ්-19 වසංගත හේතු නිසා අවාසිදායක තත්වයක් ඇතිවූ ප්‍රාදේශීය කුසලතා (උපකාණ්ඩ 887) වීසා බලපත්‍ර සඳහා අයදුම්කරුවන් හට 2020 සැප්තැම්බර් 19දින සිට කෝවිඩ්-19 සහන ලබාගත හැකිවේ.

කෝවිඩ්-19 සහන සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා Skilled Regional (subclass 887) visa බලන්න.

## මූල්‍ය දුෂ්කරතා අත්දකින වීසා බලපත්‍රධාරීන්

ඔබගේ කටයුතු කරගෙන සිටිය නොහැකි නම්, සිය මව්බිම කරා යාමට කටයුතු පිළියෙල කරගත යුතුය.